# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල


| | | | |
|---|---|---|---|
| දිනය Date: 2025.08.28 පැය 0625 | දුරකථන අංකය Tel.NO: 011-2887973 | මගේ අංකය My NO: D/Media/Out/1656 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails: dir.media@police.gov.lk |

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.</u>**

**01. සම්භාහන මධ්‍යස්ථාන මුවාවෙන් පවත්වාගෙන ගිය ගණිකා නිවාස 02 ක් වටලා සැකකරුවන් දෙදෙනෙකු හා සැකකාරියන් 03 ක් අත්අඩංගුවට - මිරිහාන පොලිස් ස්ථානය.**

2025.07.28 වන අද දින අළුයම් කාලයේ මිරිහාන පොලිස් වසමේ ඇඹුල්දෙනිය හා ස්ටැන්ලි තිලකරත්න මාවත යන ප්‍රදේශවලදී මිරිහාන පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරු මත වැටලීම් 02 ක් සිදු කර **සම්බාහන මධ්‍යස්ථාන මුවාවෙන් පවත්වාගෙන ගිය ගණිකා නිවාස 02 ක් වටලා ගණිකා නිවාස කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් සැකකරුවන් දෙදෙනෙකු සහ ගණිකා සේවයේ යෙදී සිටීමට රැඳී සිටි සැකකාරියන් 03** දෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරුවන් අවුරුදු 40 හා 50 වයස්වල පසුවන දෙයියන්දර හා රාජගිරිය ප්‍රදේශවල පදිංචිකරුවන් වන අතර සැකකාරියන් අවුරුදු 21 ත් 40 ත් අතර වයස්වල පසුවන රාගම, රත්මලාන හා අගුණකොළපැලැස්ස ප්‍රදේශවල පදිංචිකාරියන් වේ.**

මිරිහාන පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. බලපත්‍ර කොන්දේසි උල්ලංඝනය කරමින් ඉඩමක අනවසර කැණීම් කල සැකකරුවන් දහතුන් දෙනෙකු අත්අඩංගුවට - උහන පොලිස් ස්ථානය.**

2025.08.27 වන දින දහවල් කාලයේ උහන පොලිස් වසමේ වැරැන්කැටගොඩ ප්‍රදේශයේදී උහන පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් **ඉඩමක පිහිටා ඇති ගලක් බලපත්‍ර කොන්දේසි උල්ලංඝනය කරමින් පුපුරණ ද්‍රව්‍ය යොදා අනවසර කැණීමක් සිදු කරමින් සිටි සැකකරුවන් දහතුන් දෙනෙකු** කැණීම් උපකරණ සමග අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරුවන් අවුරුදු 20 ත් 66 ත් අතර වයස්වල පසුවන ඇහැලියගොඩ, කරදන, උහන හා වැරැන්කැටගොඩ ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

උහන පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 03. මාරක රිය අනතුරක් - සෙවනගල පොලිස් වසම.

2025.08.27 වන දින රාත්‍රී කාලයේ සෙවනගල පොලිස් වසමේ පුංචිවැව කටුව මාර්ගයේ කටුව ප්‍රදේශයේදී පුංචිවැව දෙස සිට කටුව දෙසට ධාවනය වූ යතුරු පැදියක් ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි ට්‍රැක්ටර් රථයක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ යතුරුපැදිකරු ඇඹිලිපිටිය රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 33 ක් වූ කිරිවැව, සෙවනගල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය ඇඹිලිපිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුරින් පසු ට්‍රැක්ටර් රථ රියදුරු ට්‍රැක්ටර් රථය සමග පලාගොස් ඇති අතර රියදුරු අත්අඩංගුවට ගැනීම සඳහා සෙවනගල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 04. රිය අනතුරක් - තංගල්ල පොලිස් වසම.

2025.08.27 වන දින සවස් කාලයේ තංගල්ල පොලිස් වසමේ තංගල්ල දික්වැල්ල මාර්ගයේ මහවෙල ප්‍රදේශයේදී දික්වැල්ල දෙස සිට තංගල්ල දෙසට ධාවනය වූ ලංගම බස් රථයක් ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි තවත් ලංගම බස් රථයක ගැටී අනතුරක් සිදුව ඇත.

අනතුරින් තුවාල ලැබූ පස් දෙනෙකු තංගල්ල රෝහලටත් එක් කාන්තාවක් නාකුළුගමුව රෝහල වෙතත් ඇතුලත් කර ඇත. මෙම බස් රථ දෙක දුර ගමන් සේවා සිදු කරන බස් රථ දෙකක් වන අතර රාත්‍රී නැවතුම සඳහා ගමන් ගන්නා අතරතුර අනතුරට ලක්වී ඇති බව දැනට සිදු කරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත. තුවාලකරුවන්ගේ තත්ත්වය බරපතල නොවන අතර අනතුර සම්බන්ධව තංගල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**